**මෙහෙයුම් උපදෙස් අංක :-** **RDD/CGIS/WCL/2020/01**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො 30, ජනාධිපති මාවත
කොළඹ 01

30.06.2020

සියලුම සහභාගීත්ව මුල්‍ය ආයතන සඳහා

**COVID-19 ව්‍යවසනය නිසා බලපෑමට පත් ව්‍යාපාර සඳහා හඳුන්වා දෙන ණය ඇප ආවරණ සහ පොලී සහන යෝජනා ක්‍රමය සඳහා වන මෙහෙයුම් උපදෙස් මාලාව**

COVID-19 ව්‍යවසන තත්වය හමුවේ බලපෑමට පත් ව්‍යාපාර සඳහා ලබා දෙන ණය හා පොලී සහන ක්‍රියාවලිය කඩිනම් කිරිම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සියලුම සහභාගීත්ව මුල්‍ය ආයතන වෙත 30.06.2020 දින නිකුත් කරන ලද අංක : RDD/CGIS/WCL/2020/01 දරණ මෙහෙයුම් උපදෙස් මාලාව.

## 1. හැඳින්වීම

1.1 COVID-19 ව්‍යවසනයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර නැවත නඟා සිටුවීම ජාතික අවශ්‍යතාවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුනාගෙන ඇති අතර, එම ව්‍යාපාර සඳහා මූල්‍ය ආයතන විසින් ණය මුදා හැරීම කඩිනම් කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දීමට තීරණය කර ඇත. මෙම නව යෝජනා ක්‍රමය මුදල් නීති පනතේ 83 වගන්තිය ප්‍රකාරව මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව “සෞභාග්‍යා COVID-19 පුනරුද සහන” යෝජනා ක්‍රමය හා සමගාමීව මුදල් මණ්ඩලය අනුමත දැනට ප්‍රකාශයට පත් කර ඇති රුපියල් මිලියන 150 තුල ක්‍රියාවට නංවනු ඇත.

1.2 සියලුම සහභාගීත්ව මුල්‍ය ආයතන තම අරමුදල් යොදා ගනිමින් බලපෑමට පත් ව්‍යාපාරවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා සහනදායී පොලී අනුපාතිකයක් යටතේ ණය ප්‍රදානය කිරිම බලාපොරොත්තු වේ. මුල්‍ය පිරිවැය ආවරණය කිරිම සඳහා පොලී සහනාධාර ලබා දීම සහ ණය අවධානම මඟ හැරීම සඳහා ඇප සුරකුම් ලබා දීම මෙම යෝජනා ක්‍රමය හරහා සිදු කෙරෙනු ඇත.

1.3 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ උප ණය ඉල්ලුම්කරුවන් සඳහා ලබා දෙනු ලබන ණය සඳහා පොලී සහනාධාර සහ ණය ඇපකර ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ඉල්ලුම් කිරීමට සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන හිමිකම් ලබනු ඇත.

1.4 මෙම ණය යෝජනා ක්‍රමයේ සියලු මෙහෙයුම් කටයුතු සඳහා අධිකාරි බලය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වේ.

**02.** **අරමුදල් සැපයීම**

මෙම ණය යෝජනා ක්‍රමය සඳහා අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුව හා රජය විසින් සපයනු ලබයි.

**03.** **සහභාගීත්ව මූල්‍ය ආයතන**

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" යෝජනා ක්‍රමය යටතේ දැනටමත් සහභාගීවන සියලුම මූල්‍ය ආයතන, මෙම යෝජනා ක්‍රමය සඳහා ද සුදුසුකම් ලබයි.

**04.** **යෝජනා ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ**

| | |
|---|---|
| 4.1 සුදුසුකම් ලබන ව්‍යාපාර | (i) මුදල් මණ්ඩල චක්‍රලේඛ අංක 05-2020 වගන්ති 2 අනුව කොවිඩ්-19 ව්‍යවසනය පැතිර යාම හමුවේ බලපෑමට පත් ඕනෑම ව්‍යාපාරයක් මේ සඳහා සුදුසුකම් ලබයි. ඒ අනුව සුදුසුකම් ලත් ව්‍යාපාරවල වාර්ෂික පිරිවැටුම රු. බිලියන 1 ට වඩා අඩු විය යුතුය. කෙසේ වුවත්, වාර්ෂික පිරිවැටුම රු. බිලියන 1 වඩා අඩුවවිය යුතු වීම සංචාරක, අපනයන හා ඒ ආශ්‍රිත සැපයුම් යන අංශ සඳහා බල නොපායි.<br>(ii) මෙම පහසුකම යටතේ මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව පමණක් සලකා බැලේ. |
| 4.2 උපරිම ණය සීමාව | එක් ණය ඉල්ලුම්කරුවකුට හෝ ව්‍යාපාරයකට උපරිමය රුපියල් මිලියන විසි පහකි . ( රු. මිලියන 25 ) |
| 4.3 ණය ඉල්ලුම්කරුවන් සඳහා වන පොලී අනුපාතය | (i) වාර්ෂික පොලී අනුපාතය 4%<br>(ii) සහභාගීත්ව මූල්‍ය ආයතන කුමන වාතාවරණයක් යටතේ වුවත් මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය 4% වඩා වැඩියෙන් අය නොකල යුතුය. |
| 4.4 පොලී සහනාධාරය | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දෙන එක් එක් උප ණය මුදල සඳහා වාර්ෂිකව සියයට පහක (5%) පොලියක් මහ බැංකුව විසින් ලබා දෙනු ඇත. |
| 4.5 සහන කාලය | (i) ව්‍යාපාරයේ ස්වභාවය මත පදනම්ව උපරිම සහන කාලය මාස 06 කි.<br>(ii) සහන කාලය තුල ණය ගැණුම්කරු විසින් අදාළ පොලිය ගෙවිය යුතුය. |
| 4.6 නැවත අය කරගැනීමේ කාල සීමාව | සහන කාලයද ඇතුලත්ව උපරිම ණය ගෙවීමේ කාල සීමාව මාස 24 කි. |
| 4.7 ඇප ආවරණය | ණය මුදලේ ප්‍රමාණය මත ඇප ආවරණය පහත පරිදි වේ.<br>80% - රු. මිලියන 0.5 ට වඩා අඩු<br>70% - රු. මිලියන 0.5 ත් රු. මිලියන 1 ත් අතර<br>60% - රු. මිලියන 1 ත් රු. මිලියන 10 ත් අතර<br>50% - රු. මිලියන 10 ත් රු. මිලියන 25 ත් අතර |
| 4.8 ඇප වාරිකය | මුළු ණය මුදලින් සියයට දශම පහකි (0.5%) |
| 4.9 සුරැකුම් | ණය ප්‍රදානය කිරීමේදී සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඇප සුරැකුම වෙනුවට ව්‍යාපාරයේ ශක්‍යතාවය හා මුදල් ප්‍රවාහය පිළිබඳව සලකා බලා ණය ප්‍රදානය කිරීම අපේක්ෂා කෙරේ. |

## 05. ණය ගැණුම්කරුවන් ලියාපදිංචි කිරිම

5.1 සියලුම සහභාගීත්ව මුල්‍ය ආයතන විසින් ණය අයදුම්පත්‍රය මත එය භාරගන්නා දිනයට අදාල දින මුද්‍රාව සටහන් කළ යුතු අතර විධිමත් ආකෘතියකින් යුතු කුවිතාන්සියක් ණය අයදුම්කරුට එදිනම ලබා දිය යුතුය.

5.2 සහභාගීත්ව මුල්‍ය ආයතනයක් අයදුම්පත්‍රය භාරගත් දිනයේ සිට දින 7ක් ඇතුළත ණය අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කල යුතු අතර යෝග්‍යතාවය හෝ එසේ නොවන බව දැනුවත් කල යුතුය.

5.3 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ යෝග්‍ය ණය ඉල්ලුම්කරුවන්ගේ විස්තර ඇතුලත් ලියාපදිංචිය කිරිමේ ලැයිස්තුව (ඇමුණුම I) මුල්‍ය ආයතනයේ ප්‍රධාන ශාඛාව හරහා බලයලත් නිලධාරියකුගේ අත්සනින් යුක්තව ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය. මෘදු පිටපත ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරනු ලබන ඊ තැපැල වෙත යොමු කල යුතු අතර ඊට සමගාමීව දෘඩ පිටපතද ලැබීමට සැලැස්විය යුතුය.

5.4 සහභාගීත්ව මුල්‍ය ආයතන සහතික විය යුතු කරුණු :

(a) ඇමුණුම I මඟින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු වල නිවරදිභාවය සහ සම්පූර්ණභාවය
(b) යෝජනා ක්‍රමයට අනුව ණය ගැණුම්කරුවන්ගේ යෝග්‍යතාවය නියමිත පරිදි තක්සේරු වී ඇති බව
(c) තක්සේරු කිරිමට අදාල සියලුම ලේඛණ ලබා ගෙන ඇති බව

5.5 මුල්‍ය ආයතනවලින් ඇමුණුම I ලැබුණු පසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි ඇතුලත් වන තොරතුරු සහ ණය ඉල්ලුම්කරුගේ යෝග්‍යතාවය ණය ඉල්ලුම්කරුට ලබා දිය යුතු ණය මුදල් ප්‍රමාණය තහවුරු කරනු ලබයි. ඒ අනුව මහ බැංකුව විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ යෝග්‍ය ණය ඉල්ලුම් කරුවන් ලියාපදිංචි කරනු ඇත.

5.6 ණය ගැණුම්කරුවන්ගේ ලියාපදිංචිය අනුව එක් එක් ණය සඳහා ලියාපදිංචි අංකයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අතර එම ලියාපදිංචි අංකය අදාල සහභාගීත්ව මුල්‍ය ආයතනයේ ප්‍රධාන ශාඛාව වෙත දැනුම්දෙනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව අදාල ණය ගැණුම්කරු සම්බන්ධයෙන් ඉදිරියේදී සිදුවන සියලුම ලිපි ලේඛන මෙම ලියාපදිංචි අංකය හා බැඳේ.

5.7. ඇමුණුම I මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇති තොරතුරුවල කිසියම් වෙනසක් හෝ සාවද්‍ය බවක් ඇති නම්, කිසිදු පෙර දැනුම් දීමකින් තොරව එම ණය ඉල්ලුම්කරුගේ ලියාපදිංචිය අවලංගු කිරිමේ හිමිකම මහ බැංකුව සතුය.

5.8 ණය අයදුම්පත් ලියාපදිංචි කිරීමේදී වැඩිදුරටත් කරුණු පැහැදිලි කර ගැනීමේ අවශ්‍යතාවක් ශ්‍රී ලංකා මහ බැංකුවට ඇති වුවහොත්, එම අයදුම්පත් නැවත අදාළ සහභාගීත්ව ආයතනවලට හරවා යැවීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

5.9 ඉහත 5.5 ඡේදයට අනුව වැඩිදුර තොරතුරු විමසීමකදී හෝ නිවරදිභාවය තහවුරු කර ගැනීමක් සඳහා සහභාගීත්ව මුල්‍ය ආයතන අදාල සියලුම ලියකියවිලි සහ සටහන් පවත්වා ගත යුතුය.

5.10 ඇමුණුම අංක I ට අනුව ණය ලියාපදිංචි කිරිමේ ලැයිස්තුව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට භාර දීමේ අවසාන දිනය 31.08.2020 වේ.

**06.** **ණය මුදා හැරීම**

6.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ලියාපදිංචි අංක ලැබුණු පසු සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඇමුණුම I ට අනුව යෝග්‍ය ණය ඉල්ලුම්කරුවන් සඳහා වැඩ කරන දින 7ක් ඇතුලත ණය මුදා හැරිය යුතුය.

6.2 6.1 වගන්තිය පරිදි කිසියම් මූල්‍ය ආයතනයකට, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වූ ණය ඉල්ලුම්කරුවකුට අදාල කාල වකවානුව තුල ණය මුදා හැරීමට නොහැකි වුවේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් පිලිගත හැකි හේතු දින 7 ක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද හේතුන් පිළිබඳව විමසා බැලීමක් සිදු කරනු ලබන අතර ඒ අනුව, සුදුසු තීරණ/ක්‍රියාමාර්ග ගනු ඇත.

6.3 යම් හේතුවක් නිසා ණය මුදාහැරීමට නොහැකි වීම හෝ ඒ පිළිබඳ පිළිගත හැකි හේතුවක් ලියාපදිංචි දිනයේ සිට දින 30 ක් ඇතුලත ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත්, අදාල සහභාගීත්ව මූල්‍ය ආයතනයට පෙර දැනුම් දීමකින් තොරව අදාල ණය ඉල්ලුම්කරුගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ හිමිකම මහ බැංකුව සතුවේ.

**7.** **පොලී සහනාධාරය ගෙවීම**

7.1 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් වලට අදාල නියමයන් හා කොන්දේසීන්ට යටත්ව හා අනුකූලව ගිවිසුම් ගතව ලබා දුන් ණය සඳහා වාර්ෂිකව 5% පොලී සහනාධාරයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙනු ඇත.

7.2 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය සහනාධාරය සඳහා සුදුසුකම් ලබා ගැනීමට නම් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සෑම අවස්ථාවකම 4.3 වගන්තියෙහි සඳහන් කර ඇති පොලී අනුපාතය යටතේ සුදුසුකම් සපුරා ඇති ණය ඉල්ලුම්කරුවන්ට මෙහෙයුම් උපදෙස් මාලාවේ 4.8 වගන්තිය හා අනුකූලව ණය ලබා දිය යුතුය.

7.3 මෙම මෙහෙයුම් උපදෙස් හි කිසිදු කොන්දේසියක් හො සමහ අනුගත නොවන විටදී යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා මහ බැංකුවෙන් ලබා දෙන පොලී සහනාධාරය හෝ ණය ඇප වාරිකය ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන සුදුසුකම් නොලබනු ඇත.

7.4 පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පොලී සහනාධාරය ලබා දෙනු ඇත.

7.4.1 අංක 6.1 වගන්තිය අනුව මහ බැංකුවේ ලියාපදිංචි ණය ගැණුම්කරුවන්ට සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය මුදා හැරිය යුතුය. සම්පූර්ණ කරන ලද ඇමුණුම II සහ එක් එක් ණය මුදලට අදාල 0.5 ක ඇප වාරිකයත්, ණය මුදාහැර දින 30 ක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබීමට සැලැස්විය යුතුය.

7.4.2 සහභාගීත්ව මූල්‍ය ආයතන තම ප්‍රධාන ශාඛාව මඟින් අර්ධ වාර්ෂිකව ඇමුණුම III සම්පූර්ණ කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවිය යුතු අතර මෙහෙයුම් උපදෙස් මාලාවේ අංක 7.4.4 වගන්තියෙහි සඳහන් පරිදි නියමිත කාලයන්ට අනුකූලව විය යුතුය. එම අයදුම්පත් හි මෘදු පිටපත හා දෘඩ පිටපත ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබීමට සැලැස්විය යුතුය.

7.4.3. අර්ධ වාර්ෂිකව ලබා දෙන පොලී සහනාධාරය දින 365 මත පදනම්ව, හීනවන ශේෂ ක්‍රමය ඔස්සේ මාසිකව ගණනය කරනු ලබයි. එක් එක් ණය ඉල්ලුම්කරු සඳහා වන පොලී සහනාධාරය ණය ආපසු ගෙවීමේ ලේඛනය මඟින් ගණනය කරනු ලබන ප්‍රාග්ධන (දැනට පවතින) මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගණනය කරනු ලබයි.

7.4.4 ණය යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාරය ඉල්ලුම් කිරීම සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම III එක් එක් වර්ෂයන් හි ජනවාරි සහ ජූලි යන මාසයන් හි 15 වන දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවිය යුතුය.

7.4.5. ඇමුණුම III දෘඪ පිටපත "අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නො 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතු අතර, මෘදු පිටපත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන විද්‍යුත් තැපැල වෙත එවිය යුතුය.

7.4.6 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම III ලැබීමෙන් දින 30 ක් ඇතුලත මහ බැංකුව විසින් 4.4 වගන්තියෙහි සඳහන් වන පරිදි පොලී සහනාධාර නිදහස් කරනු ඇත.

7.4.7 වැඩි විස්තර අවශ්‍ය අවස්ථා වලදී, ඕනෑම සහභාගීත්ව මූල්‍ය ආයතනයක පොලී සහනාධාර අයදුම්පත් අත්හිටුවීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. තවද, ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් වලට අනුකූල නොවන පොලී සහනාධාර අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ද ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

7.4.8 ඉදිරියේදී ගෙවීමට නියමිත පොලී සහනාධාර ගෙවීම් වලින්, පෙර ගෙවිය යුතු ගෙවීම් වැඩි/අඩු පියවීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

7.4.9 පොලී සහනාධාරය ලබා දෙනු ලබන්නේ එක් එක් උප ණය මුදලක් සඳහා උපරිමය මාස 24ක කාලයක් සඳහා පමණි.

7.4.10 මාස 24ක නැවත ගෙවීමේ කාල සීමාව ඇතුලත, යම් සහභාගීත්ව මූල්‍ය ආයතනයක් උප ණය ගැනුම්කරුවකු සඳහා අදාළ ණය ඇප ආවරණ අයදුම් කලහොත්, පොලී සහනාධාර ගෙවනු ලබන්නේ ඇප ආවරණ අයදුම් කල දිනය දක්වා පමණි.

## 8. ණය ඇපකරය

8.1 ඇප ආවරණය

අ) සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඇපකර වාරිකය ගෙවන ලද දින සිට, ණය ඇප ආවරණය බල පැවැත්වේ.

ආ) නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලිව කටයුතු කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය අපොහොසත් වී තිබේ නම් හෝ ණය ලබා දීමේදී නොසැලකිලිමත් වී ඇත්නම්, සහ/හෝ නැවත අයකර ගැනීමේ සාධනීය ක්‍රියා පිළිවෙලක් අනුගමනය නොකරමින් ණය ගිණුම අධීක්ෂණය කර ඇත්නම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ තීරණය අනුව ඇප ආවරණය නවතා දැමීමේ හැකියාව ඇත.

### 8.2 ඇපකර වාරික ගෙවීම

අ) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු ඇප ණය ආවරණ වාරිකය, ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් ඕනෑම උප ණය ගැනුම්කරුවෙකුට නිකුත් කරන ලද උප ණය මුදලේ වටිනාකමින් සියයට දශම පහක් (0.5%) ලෙස ගණනය කෙරේ.

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය ඇප ආවරණ වාරිකය ගෙවීමට අපොහොසත් වීම, අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනය ණය ඇප ආවරණ ලබා ගැනීම සඳහා නුසුදුස්සෙකු සේ සළකනු ලබයි.

ඈ) නැවත ආපසු ගෙවීමේ කාලය දීර්ඝ නොකළ හොත්, ණය ඇප ආවරණය මාස විසි හතරක (24) ආපසු ගෙවීමේ කාලය අවසානයේ දී, ක්‍රියාත්මක වීම නවතිනු ඇත.

ඇ) ඇප වාරික ප්‍රකාශය (Premium Statement) (ඇමුණුම II) ඒ සඳහා ගෙවිය යුතු වාරිකය සමඟ අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතුය.

ඉ) ඇප වාරික ගෙවීම අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව නමට චෙක්පතක් මඟින් තත්කාලීන දළ ගෙවීම්/පියවීම් පද්ධතිය (RTGS) හරහා අංක 2-54518 දරණ ප්‍රාදේශීය සංවර්ධනය දෙපාර්තමේන්තුවේ ගිණුම වෙත බැර කල යුතුය.

ඊ) ණය ඇප වාරික සඳහා අදාළ පිරිවැය, අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් දරා ගත යුතු අතර, ණය ගැනුම්කරුවන් වෙත එය පැවරීම නොකළ යුතුය.

**9. සහභාගීත්ව මූල්‍ය ආයතන වල වගකීම්**

9.1 ණය ලියාපදිංචි කිරීමට/ණය මුදාහැරීමට පෙර සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් පීඩාවට පත් ව්‍යාපාරය නැවත නගා සිටුවීමට ඇති හැකියාව පිළිබඳ තක්සේරු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ගයන් ගත යුතුය.

9.2 සහභාගීත්ව මූල්‍ය ආයතන සෑම විටම උප ණය ගැනුම්කරුවන් සඳහා ණය මුදල් මුදා හැරීමේ දී වඩාත් සැලකිල්ලෙන් හා විචක්ෂණශීලීව කටයුතු කල යුතු අතර, ණය මුදල මුදා හරින ලද අරමුණ සඳහා ම එය භාවිත කරන බව තහවුරු කර ගත යුතුය.

9.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් උප ණය ගැනුම්කරුවන්ගේ ගිණුමේ තත්ත්වය සහ මෙහෙයුම් අධීක්ෂණය කළ යුතු අතර, සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත සිදුවන පාඩු අවම කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී කඩිනම් පියවර ගත යුතුය.

9.4 ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු අයකර ගැනීම සඳහා අවශ්‍ය සහ ප්‍රමාණවත් පියවර සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ගත යුතුය.

9.5 මෙහෙයුම් උපදෙස් වල ඇතුලත් 8.2 වගන්තිය ප්‍රකාරව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය ඇප වාරික ගෙවීම සිදු කල යුතුය.

9.6 ණය යෝජනා ක්‍රමයට අදාළ දත්ත සහ තොරතුරු සහභාගීත්ව මූල්‍ය ආයතනය සතුව පවත්වා ගත යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති ආකෘති පදනම් කර ගනිමින් හෝ වෙනත් ආකාරයකින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා ඉල්ලා සිටින දත්ත හා තොරතුරු ලබා දිය යුතුය.

9.7 ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව, ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති කිසිඳු උප ණයක් කපා හැරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන හට අවසර නොමැත.

**10. ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම්**

10.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය යෝජනා ක්‍රමය සඳහා අදාළ මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන අතර අවශ්‍ය විටෙක සංශෝධන සිදු කරනු ලැබේ.

10.2 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ධ-වාර්ෂිකව අදාළ පොලී සහනාධාර සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගෙවීම සිදු කරනු ලබයි.

10.3 මෙහෙයුම් උපදෙස් හි 8.2 වගන්තිය ප්‍රකාරව සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය ඇප වාරික ගෙවා ඇති සුදුසුකම් ලත් උප ණය ගැනුම්කරුවන් සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත ණය ඇප ආවරණ නිකුත් කරයි.

10.4 ශ්‍රී ලංකා මහ බැංකුව, ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය අධීක්ෂණය/ඇගයීම සහ අවශ්‍ය විටෙක ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවනු ලබයි.

10.5 සහභාගීත්ව මූල්‍ය ආයතනය ණය යෝජනා ක්‍රමයේ නියමයන් හා කොන්දේසි උල්ලංගනය කරයි නම්, ඒවාට අනුකූල වීමට අසමත් වේ නම්, නොසලකා හරියි නම් හෝ විචක්ෂණ නොවන ක්‍රියාවන් හෙළිදරව් වේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලද ඕනෑම ණය ඇප ආවරණයක් අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

## 11. ණය පැහැර හැරීම් වාර්තා කිරීම

11.1 කිසියම් උප ණයක් හෝ වාරිකයක්, උප ණයගැතියා විසින් නියමිත දිනට ආපසු නොගෙවන්නේ නම්, උප ණය ගැනුම්කරුවාගෙන්/ණයකරුවන්ගෙන් එම හිඟ ණය මුදල් අයකර ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් කඩිනම් හා ඵලදායි පියවර ගත යුතුය.

11.2 ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය, අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කල විට, ණය වර්ගීකරණය, ආදායම් හඳුනා ගැනීම සහ ප්‍රතිපාදන සැපයීම පිළිබඳ 2008 අංක 03 සහ 04 බැංකු පනත අනුව සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක් එක් උප ණය ගැනුම්කරුගේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබා දිය යුතුය. මෙම වාර්තාව පහත විස්තර ඇතුලත් විය යුතුය.

11.2.1 උප ණය ගැනුම්කරු මුහුණ පා ඇති ගැටළු පිළිබඳ ඇගයීම් වාර්තාවක්

11.2.2 උප ණය ගැනුම්කරුගේ නැවත ගෙවීමේ හැකියාව පිළිබඳ තක්සේරු වාර්තාවක්

11.2.3 ණය මුදල් නැවත අයකර ගැනීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ගන්නා ලද පියවර සහ ඉදිරි ක්‍රියාමාර්ග.

11.2.4 නැවත අයකර ගැනීමට/නැවත යථා තත්ත්වයට පත් කිරීමට ඇති හැකියාව සම්බන්ධව සහභාගීත්ව මූල්‍ය ආයතනයේ අදහස

11.2.5 ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි අවශ්‍ය වන අනෙකුත් තොරතුරු

## 12. හිමිකම් පෑමේ ක්‍රියාපටිපාටිය

12.1 කිසියම් ණය මුදලක් පැහැර හැරීමක් සහ/හෝ ණය ගැනුම්කරුට මෙහෙයුම් උපදෙස් හි 11 වන වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වීමට නොහැකි වුවහොත්, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් අදාළ ණය අක්‍රීය ණය කාණ්ඩයට ඇතුලත් කල දින සිට දින 30ක් ඇතුලත ණය ගැනුම්කරු වෙත ඉල්ලුම් පොරොන්දු පත්‍රිකාවක් යැවිය යුතුය.

12.2 පසුව, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය ගැනුම්කරුට ඉල්ලුම් පොරොන්දු පත්‍රිකාවක් ලබා දුන් දින සිට මාසයක් ඉකුත් වීමෙන් පසු නමුත් මාස දෙකකට නොඅඩු කාලසීමාවක දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත හිමිකම් පෑමක් ඉදිරිපත් කල යුතුය.

12.3 ණය ගැනුම්කරුට නිකුත් කරන ලද ඉල්ලුම් පොරොන්දු පත්‍රිකාවක් (Demand Notice) සහතික කල පිටපත් සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා භාරගෙන ඇති බවට ලද සාක්ෂි ද සහිතව හිමිකම් ඉල්ලුම් පත්‍රය (ඇමුණුම IV ) යැවිය යුතුය.

12.4 මෙහෙයුම් උපදෙස් හි 12.5 සහ 12.8 වගන්තියට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාරික දෙකකින් අදාළ සහතික කළ ණය ඇප ආවරණ පියවනු ලැබේ.

12.5 ඇමුණුම IV ලැබීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළමු වාරිකය ගෙවනු ලැබේ. එනම්, ණය මුදලේ පවතින හිඟ මුදල මත පදනම්ව සහතික කළ ඇප මුදලින් සියයට පනහකි (50%).

12.6 ණය පැහැර හරින ලද සියලුම ණය ගැනුම්කරුවන්ට එරෙහිව සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ගත යුතුය. පැහැර හරින ලද රුපියල් ලක්ෂ පහ (500,000) ට අඩු ණය සමථ මණ්ඩලයට යොමු කරන අතර, රුපියල් ලක්ෂ පහ (500,000) ට වැඩි ණය සඳහා සුදුසු පරිදි නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

12.7 මෙහෙයුම් උපදෙස් යටතේ අවශ්‍ය අධීක්ෂණ හා ක්‍රියාමාර්ග ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය සමත් වී හෝ ඒ පිළිබඳ නොසැලකිලිමත් වී ඇති බව තහවුරු වුවහොත්, දැනටමත් ගෙවා ඇති ණය ඇප ආවරණ මුදල නැවත ඉල්ලා සිටීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

12.8 පළමු වාරිකය ගෙවීමෙන් පසු, අවසාන වාරිකය ගෙවීම සඳහා නෛතික/ප්‍රතිසාධන ක්‍රියාමාර්ගයන්ගෙන් පැන නඟින නඩු අංක සමඟ නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම V, ඉහත 12.5 වගන්තියේ සඳහන් කර ඇති පරිදි පළමු වාරිකය ගෙවීමෙන් මාස හයක් (06) ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

## 13. නැවත අයකර ගැනීමේ ක්‍රියාපටිපාටිය

13.1 ණය ඇප ආවරණ ලබා ගැනීමට ඇති හැකියාව නොසළකා, ණය යෝජනා ක්‍රමය යටතේ උප ණය අයකර, ගැනීම අධීක්ෂණය කිරීම සඳහා නිසි අභ්‍යන්තර යාන්ත්‍රණයක් සහභාගීත්ව මූල්‍ය ආයතනය සතුව තිබිය යුතුය.

13.2 කිසියම් කල් ඉකුත් වූ ණය මුදලක් ආපසු අයකර ගැනීමට කඩිනම් හා ඵලදායි පියවර සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ගතයුතු අතර, ගන්නා ලද පියවරයන් සහ ව්‍යාපාරයේ ප්‍රගතිය පිළිබඳව අවශ්‍ය අවස්ථාවක දී ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කළ යුතුය.

13.3 පැහැර හරින ලද උප ණය ගැනුම්කරුවන්ට එරෙහිව ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කරනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ගත යුතුය. ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඇප ආවරණය ලබා ගැනීමෙන් පසුව වුවද, එවැනි උප ණය ගැනුම්කරුවන්ට එරෙහිව දැනටමත් ගෙන ඇති අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් අත්හිටුවිය නොහැක.

## 14. පසු හිමිකම් අයකර ගැනීම

14.1 ණය ඇප ආවරණ ලබා ගැනීමෙන් පසු, උප ණය ගැනුම්කරුවන්ගෙන් සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ආපසු අයකර ගැනීම් තිබේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගීත්ව මූල්‍ය ආයතනය අතර 80:20, 70:30, 60:40 සහ 50:50 යන අනුපාතයන්ට බෙදා ගත යුතුය. මේ සඳහා 'ඇමුණුම VI'ආකෘතිය භාවිතා කළ හැකිය. සෑම වසරකම ජුනි 30 සහ දෙසැම්බර් 31 යන දින සිට දින 30ක් ඇතුලත, නිසි පරිදි සම්පූර්ණ කරන ලද 'ඇමුණුම VI' ආකෘතිය සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අර්ධ-වාර්ෂිකව ලැබීමට සැලැස්විය යුතුය.

14.2 ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ලබා ගත් මුළු ඇප ආවරණ මුදල සහ අයකර ගැනීම් ආදිය සඳහන් ලේඛනයක් සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් පවත්වා ගත යුතු අතර, එම ලේඛනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය පවරන ලද ඕනෑම නිළධාරියෙකුට ලබා දිය යුතුය.

14.3 පැහැර හරින ලද උප ණය අයකර ගැනීම සඳහා වන නෛතික වියදම්, උප-ණය ගැනුම්කරුවන්ගෙන් අයකර ගන්නා මුදලින් පළමුව අය කර ගත යුතු අතර ඉතිරි මුදල ඉහත 14.1 වගන්තියේ දක්වා ඇති අනුපාතයට ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ බෙදා ගත යුතුය.

## 15. පරීක්ෂා කිරීම

15.1 ණය යෝජනා ක්‍රමයේ අරමුණු සඳහා අවශ්‍ය පරිදි, යෝජනා ක්‍රමය යටතේ සහතික කර ඇති ඕනෑම ණයක් සඳහා අදාළ ගිණුම් පොත් සහ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ වෙනත් වාර්තා පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව හට අයිතිය ඇත.

15.2 ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යාකරණය කර ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන ලියකියවිලි හා ගිණුම් පොත් අවශ්‍ය විටෙක ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දීමට සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් නිළධාරීන්ට ව්‍යාපාරය පරීක්ෂා කිරීමට අවසර දිය යුතු බවට, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් උප ණය ගැනුම්කරුට ණය ලබා දීමේ දී කොන්දේසියක් පැනවිය යුතුය.

15.3 සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය යෝජනා ක්‍රමයේ නියමයන් හා කොන්දේසි උල්ලංඝනය කර ඇති බව පෙනී යන්නේ නම්, ඇප ආවරණ සහ/හෝ හිමිකම් පියවීම සඳහා කරන ලද ගෙවීමක් අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

## 16. තොරතුරු සැපයීම

සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය යෝජනා ක්‍රමය යටතේ සහතික කර ඇති ඕනෑම ණයක් සම්බන්ධයෙන් අදාළ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අවශ්‍ය පරිදි ලබා දිය යුතුය.

17. වෙනස් කිරීම් සහ පරිපූරක විධිවිධාන

17.1 ණය යෝජනා ක්‍රමය යටතේ නිකුත් කර ඇති කිසියම් ණය ඇප ආවරණයක් මඟින් පැන නගින අයිතිවාසිකම් හෝ බැඳීම් වලට බලපෑම් නොකර, යෝජනා ක්‍රමය වෙනස් කිරීමට හෝ ඉවත් කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අයිතිය ඇත.

17.2 ණය යෝනා ක්‍රමයේ නිශ්චිතව දක්වා නොමැති ඕනෑම කරුණක් සම්බන්ධයෙන් වුවද, යෝජනා ක්‍රමයේ අරමුණු සඳහා අවශ්‍ය පරිදි පරිපූරක හෝ අතිරේක විධිවිධාන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබේ.

මෙම ණය යෝජනා ක්‍රමය 2020 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව